**උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම) – 2015**

---

උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ (නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන අපනයන - ආනයන බැංකුව අතර 2011 අප්‍රේල් 29 දින එළඹි අංක බීඑල්ඒ 201111 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක් පුනරුත්ථාපනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 56.9 ක් වූ අතර ඉන් එජඩො මිලියන 48.3 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2011 නොවැම්බර් 10 දින ආරම්භ කරන ලද අතර 2014 මැයි 09 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 මැයි 12 දිනට බොහෝදුරට නිම කර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1** **මතය**
**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|
| | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දින දක්වා |
| | එජඩො. මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන - ආනයන බැංකුව | 48.3 | 6,532.5 | 932.02 | 6422.28 |
| ශ්‍රී ලං ර | 8.6 | 1,289.8 | 21.39 | 1,247.58 |
| මා සං අ - විශේෂ ණය | - | - | - | 23.98 |
| | 56.9 | 7,822.3 | 953.41 | 7,693.84 |

**3.2 භෞතික ප්‍රගතිය**

2011 නොවැම්බර් 10 දින ආරම්භ කරන ලද නවට්කුලි - කරෙයිතිවු - මන්නාරම මාර්ගයේ කිලෝමීටර් 67 ක පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩ නිමකර 2014 මැයි 15 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. ව්‍යාපෘති ලියකියවිලි අනුව, උතුරු පළාතේ මාර්ග ජාලය ජාතික ප්‍රමිතීන් දක්වා වැඩිදියුණු කිරීම හා පදිකයින් සහ පාපැදිකරුවන් සඳහා යහපත් හා ආරක්ෂිත ප්‍රවේශයක් ලබාදීම අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද අවශ්‍ය ජාතික ප්‍රමිතීන් සැලකිල්ලට ගැනීමෙන් තොරව මාර්ගයේ පළල මීටර් 1.2 කින් අඩුකර තිබුණි. තවද සංගුපිඩ්ඩි පාලම ඇතුළුව පාලම් 6 ක පුනරුත්ථාපන කාර්යයන්ද කපා හැර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

දෝෂ දැන්වීම් කාලපරිච්ඡේදය 2015 නොවැම්බර් 15 දක්වා මාස 6 කින් දීර්ඝ කර තිබුණද, 2015 මැයි 13 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී ඉංජිනේරු විසින් හඳුනාගෙන තිබූ පුනරීන් කොටසේ කිලෝමීටර් 23+700 හි ඇස්පල්ට් ඇතිරීම පිළිබඳ අඩුපාඩු, බෝක්කු 03 ක මට්ටම්වල වෙනස්කම් හා මාර්ගයේ ස්ථාන 3 ක රළපනාව (rip rap) ආරක්ෂාව පිළිබඳ අඩුපාඩු නිවැරදි කිරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නොවිසඳුණු කරුණු**

---

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ඡේදවලට පටහැනිව, රු.758,439 ක් වූ පොදු කාර්ය පිරිවැය හා ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට පෙර වර්ෂයේදී ගෙවන ලද රු.629,104 ක ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අයකරගෙන තිබුණි. තවද මෙම පරිචය අඛණ්ඩව සිදුකරන බවත් සමාලෝචිත වර්ෂයේදීද පොදුකාර්ය පිරිවැය රු.මිලියන 1.59 ක් හා ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා රු.210,938 ක් ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයට පටහැනිව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කර තිබුණි.